## රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව
## සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය

**ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම - 2025**

රාජ්‍ය සේවයේ බඳවාගැනීම් ක්‍රියාවලිය සමාලෝචනය කිරීම සහ කාර්යමණ්ඩලය කළමනාකරණය මැයෙන් අංක අමප/25/0399/802/004-II හා 2025.03.10 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව හා අංක 2199/10 හා 2020.10.27 දිනැති ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථාවට අනුකූලව ආයුර්වේද දෙපාර්තමේන්තුවේ වෛද්‍ය නිලධර ගණයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී පුරප්පාඩු තනතුරු 304ක් සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

ඒ අනුව මෙම නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් 2025 ජුනි මස 24 දිනට සපුරාලන සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියමය පරිදි සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර ආයුර්වේද කොමසාරිස් ජනරාල්, ආයුර්වේද දෙපාර්තමේන්තුව, පරණ කොට්ටාව පාර, නාවින්න, මහරගම ලිපිනය වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. කවරයේ වම්පස ඉහල කෙළවරේ **"ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරී තනතුරට බඳවා ගැනීම-2025"** යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. **තවද බඳවා ගැනීමේ අයදුම්පත්‍රයේ සඳහන් කරන නම සිංහල මාධ්‍ය අයදුම්කරුවන් විසින් සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින්ද, දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් විසින් දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි බසින්ද සඳහන් කළ යුතුය.**

**අයදුම්පත් කැඳවන අවසාන දිනය 2025 ජුනි මස 24 දින වේ.**

**සටහන :** අයදුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ආයුර්වේද / සිද්ධ / යුනානි උපාධිය ලත් උපාධිධාරීන් අදාළ වර්ෂ වල විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලබන කුසලතා ලේඛනයේ අනුපිළිවෙල පදනම් කරගෙන බඳවාගනු ලැබේ. වසර කිහිපයකට අදාළ උපාධිධාරීන් අයදුම්කරුවන් ලෙස ඉදිරිපත් වන අවස්ථාවකදී ඒ ඒ වර්ෂයන්හි කුසලතා ලේඛනය පදනම් කර ගනිමින් එම කුසලතා ලේඛනයෙහි සඳහන් අනුපිළිවෙලට ප්‍රමුඛතාවය දෙමින් පත්කිරීම් බලධරයා විසින් පත්කරන ලද සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**02.** බඳවා ගන්නා ශ්‍රේණිය : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ ප්‍රාථමික ශ්‍රේණිය

**03. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :**

I. මෙම පත්වීම විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට ඔබ යටත් විය යුතුය.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුනක (03) පරිවාස කාලයකට යටත් වන අතර, ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමෙන් පසු උසස් කිරීම් සිදුකරනුයේ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ දැක්වෙන නියමයන් හා කොන්දේසි වලට අනුකූලව ය.

III. නවක පත්වීම්ලාභීන් ඔවුන්ගේ කුසලතා අනුපිළිවෙල මත පුරප්පාඩු පවතින සේවා ස්ථාන වෙත ස්ථානගත කරනු ලබන අතර, මුල් පත්වීම අනුව වැඩ භාරගත් නිලධාරීන් සිය මුල් සේවා ස්ථානයේ අනිවාර්ය වසර තුනක (03) පරිවාස සේවා කාලය අවසන් වන තෙක් සේවය කළ යුතුය. එම කාලය තුළ ස්ථාන මාරුවීම් අපේක්ෂා නොකළ යුතු අතර මෙම කාලය තුළ ස්ථාන මාරු ලබා දීමටද කටයුතු නොකෙරේ.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, අංක 2199/10 හා 2020 ඔක්තෝබර් මස 27 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් පත්‍රයේ පළ වූ ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ ඇතුලත් නියමයන් සහ කොන්දේසි වලටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝග වලට ද මෙම පත්වීම යටත්වේ.

**04. වැටුප් පරිමාණය :**

මෙම තනතුරට රු. 91,750 – 3 x 2,400 – 7 x 2420 – 2 x 2940 – 16 x 3900 - රු. 184,170/- (SL-2-2025) මාසික වැටුප් පරිමාණයක් හිමිය.

**05. වයස් සීමාව :**

2025 ජුනි මස 24 දිනට

අවම සීමාව : අවුරුදු 22 යි

උපරිම සීමාව : අවුරුදු 45 යි

**06. සුදුසුකම් :**

**I.අධ්‍යාපන සුදුසුකම් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් ආයුර්වේද / සිද්ධ / යුනානි වෛද්‍ය විද්‍යාව පිළිබඳ පස් අවුරුදු උපාධියකින් පසුව එක් අවුරුදු සීමාවාසික රෝහල් පුහුණුවක් ලබා තිබීම.

**II. වෘත්තීය සුදුසුකම්** : ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය ලබා තිබීම.

**III. පළපුරුද්ද** : අදාළ නොවේ.

**IV. කායික සුදුසුකම්** : සෑම අපේක්ෂකයෙකුම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරී ඉටු කිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුයි.

**V. වෙනත් සුදුසුකම් :**

- අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් හා මනා ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුයි.

**07. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයන් පමණි. සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික වල මුල් පිටපත් හා නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී පහත සඳහන් ලියකියවිලි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය ඉල්ලා සිටින විටෙක ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් සූදානම්ව සිටිය යුතුය.

(i) උප්පැන්න සහතිකය

(ii) සවිස්තරාත්මක උපාධි සහතිකය

(iii) ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි සහතිකය

(iv) ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කළ ග්‍රාම නිලධාරී සහතිකය

(v) ජාතික හැඳුනුම්පත

**08**. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආකෘතියක් මෙම නිවේදනයේ අවසානයේ දැක්වේ. අයදුම්පත්‍රය සෙ.මී.22 x 29 ප්‍රමාණයේ A4 කඩදාසි වල සකස් කළ යුතු අතර, අංක 01 සිට 07 තෙක් ශීර්ෂ පළමු පිටුවටද, අංක 08 සිට 10 වන තෙක් ශීර්ෂ දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු **තම අත් අකුරෙන්ම** පැහැදිලිව ඇතුලත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර සහ අසම්පූර්ණ අයැදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
අදාළ අයදුම්පත්‍රයේ ආකෘතියක් www.ayurveda.gov.lk මඟින්ද ලබා ගත හැක.

**09.** සාවද්‍ය තොරතුරු සැපයීම

- ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් සාවද්‍ය බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය දැනුම් දීමකින් තොරව අවලංගු කරනු ලැබේ.

- එබඳු සාවද්‍ය තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව වුවද අනාවරණය වුවහොත් ඊට අදාළ නීතිමය ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**10. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව සතු වේ.**

**11.මෙම නිවේදනයෙහි විධිවිධාන සැලසී නොමැති කරුණු සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුව විසින් තීරණය කරනු ලැබේ.**

**12.මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල පාඨය බල පැවැත්විය යුතු වන්නේය.**

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ නියෝගය පරිදි,

**විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ**
ලේකම්
සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
2025.05.23